සැ. යු. - 2018.06.08 වැනි දින පළ වූ අංක 2075 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,076 - 2018 ජුනි මස 14 වැනි බ්‍රහස්පතින්දා - 2018.06.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 1342 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1343 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1344 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1349 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2018 ජූලි මස 06 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 ජුනි මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**මහාධිකරණය, කුරුණෑගල**

රාජසන්තක කරන ලද වාහන ටෙන්ඩර් මගින් විකිණීම - 2018

කුරුණෑගල මහාධිකරණ කලාපීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පොල්ගහවෙල මහෙස්ත්‍රාත් අධිකරණය, පිලැස්ස මහෙස්ත්‍රාත් අධිකරණය, ගල්ගමුව මහෙස්ත්‍රාත් අධිකරණය සහ මහව දිසා අධිකරණය මගින් රාජසන්තක කරන ලද පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති රථ වාහන ප්‍රසිද්ධ ලංසු කැඳවීම මගින් විකිණීම සඳහා මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ. අදාළ ලංසු කැඳවීම්පත් 2018.06.18 සිට 2018.07.02 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළ කුරුණෑගල මහාධිකරණ කාර්යාලයේදී ලබා ගත හැක. ටෙන්ඩර් අයදුම්පත්‍ර ගාස්තුව ලෙස ආපසු නොගෙවන රු. 100.00 ක් ද ආපසු ගෙවන රු. 10,000.00 ටෙන්ඩර් තැන්පතු මුදලක් ද අයදුම්පත්‍රය ලබාගන්නා අවස්ථාවේදී ගෙවිය යුතු වේ. අයදුම්පත්‍රය සමග වාහන ලංසු කැඳවීමට අදාළ අනිකුත් සියලු විස්තර, ලියවිලි හා කොන්දේසි ඔබට ලබාදීමට නියමිතය. 2018.07.03 වැනි දින මධ්‍යාහ්න 12.00ට ලංසු අයදුම්පත් බාර ගැනීම අවසන් කරනු ලැබේ.

**මහෙස්ත්‍රාත් අධිකරණය - ගල්ගමුව**

| *නඩු අංකය* | *වාහන ලි.ප. අංකය* | *වෙළෙඳ නාමය/වර්ගය* | *වෙන්දේසි කලහැකි ආකාරය* | *පරීක්ෂා කල හැකි ස්ථානය* |
|---|---|---|---|---|
| 90511 | UP GL - 8710 | ටොයෝටා ලොරි රථය | ලියාපදිංචි කල හැක | මහෙස්ත්‍රාත් අධිකරණය ගල්ගමුව |
| 9273 | WP JS-6300 | ලංකා අශෝක ලේලන්ඩ් ලොරි රථය | ලියාපදිංචි කල හැක | මහෙස්ත්‍රාත් අධිකරණය ගල්ගමුව |

**මහෙස්ත්‍රාත් අධිකරණය - පිලැස්ස**

| | | | | |
|---|---|---|---|---|
| 56688 | 47-9928 | නිසාන් ඇට්ලස් ලොරි රථය | කැබලි වශයෙන් | මහෙස්ත්‍රාත් අධිකරණය පිලැස්ස |
| 60528 | GU-6498 | ටෝයොටා ලොරි රථය | කැබලි වශයෙන් | මහෙස්ත්‍රාත් අධිකරණය පිලැස්ස |
| 69977 | GJ-6569 | මැසිෆර්ගියුෂන් 135 රෝද 4 ට්‍රැක්ටරය | කැබලි වශයෙන් | මහෙස්ත්‍රාත් අධිකරණය පිලැස්ස |
| 79072 | --- | මිට්ෂුබිෂි එක්ස්කැවේටර් යන්ත්‍රය | ---- | මහෙස්ත්‍රාත් අධිකරණය පිලැස්ස |
| 73262 | LB - 8066 | සුසුකි ලොරි රථය | ලියාපදිංචි කල හැක | මහෙස්ත්‍රාත් අධිකරණය පිලැස්ස |
| 80243 | 40-1719 | ඉසුසු එල්ෆ් ලොරි රථය | ලියාපදිංචි කල හැක | මහෙස්ත්‍රාත් අධිකරණය පිලැස්ස |
| 80278 | PR-1259 | ටාටා එස් ලොරි රථය | ලියාපදිංචි කල හැක | මහෙස්ත්‍රාත් අධිකරණය පිලැස්ස |
| 79949 | 27-3932 | ඉසුසු එල්ෆ් ලොරි රථය | ලියාපදිංචි කල හැක | මහෙස්ත්‍රාත් අධිකරණය පිලැස්ස |

**දිසා අධිකරණය - මහව**

| | | | | |
|---|---|---|---|---|
| 82693 | LB-9740 | මැස්ඩා ලොරි රථය | ලියාපදිංචි කල හැක | දිසා අධිකරණය - මහව |
| 87928 | LD-7651 | නිසාන් වර්ගයේ ලොරි රථය | ලියාපදිංචි කල හැක | දිසා අධිකරණය - මහව |

| නඩු අංකය | වාහන ලි.ප. අංකය | වෙළෙඳ නාමය/වර්ගය | වෙන්දේසි කළහැකි ආකාරය | පරීක්ෂා කළ හැකි ස්ථානය |
|---|---|---|---|---|
| **මහෙස්ත්‍රාත් අධිකරණය - පොල්ගහවෙල** | | | | |
| 3150/MISE/12 | 43-7662 | ඉසුසු එල්ෆ් ලොරි රථය | ලියාපදිංචි කළ හැක | මහෙස්ත්‍රාත් අධිකරණය පොල්ගහවෙල |
| 13679/MISE/14 | 47-9747 | ඉසුසු එල්ෆ් ලොරි රථය | ලියාපදිංචි කළ හැක | මහෙස්ත්‍රාත් අධිකරණය පොල්ගහවෙල |

සියලුම රථවාහන අදාළ අධිකරණයන්හි දී පෙ.ව. 9.30 සිට ප.ව. 3.30 දක්වා පරීක්ෂාකර බැලිය හැක.

මේනකා විජේසුන්දර,
සභාපති,
මහාධිකරණ ප්‍රසම්පාදන මණ්ඩලය,
මහාධිකරණය - කුරුණෑගල.

06-591

---

# බඩු බාහිරාදිය විකිණීම

**මහෙස්ත්‍රාත් අධිකරණය - බලපිටිය**

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම.

01. බලපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජ සන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියනලද පහත සඳහන් නඩු භාණ්ඩ 2018.06.30 වැනි දින පෙ.ව. 10.00ට බලපිටිය අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම්පාන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු අතර ඒ පිළිබඳ සලකා බැලීම සඳහා අදාළ භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරනු ලැබේ.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසර ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට පෙර වෙන්දේසියේ නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ භාර ගැනීමේදී හා මුදල් ගෙවීමේදී තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු අතර හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්‍ය වේ.

06. සියලු ගෙවීම් මුදලින් ගෙවිය යුතු අතර, මිලදී ගන්නා භාණ්ඩ වෙන්දේසිය පවත්වන දිනයේම ප.ව. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

සම්පත් එන්. ගමගේ,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු,
බලපිටිය.

2018 මැයි මස 24 වැනි දින,
බලපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ ලැයිස්තුව**

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය හා ප්‍රමාණය |
|---|---|---|
| 01 | අංක රහිත | යකඩ කුඩ ප්‍රමාණයක් |
| 02 | අංක රහිත | මුල්ලු 03 |
| 03 | අංක රහිත | ජෙනරේටර් 01 |
| 04 | අංක රහිත | රෙදි රෝල් |
| 05 | අංක රහිත | රූපවාහිනී 01 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය හා ප්‍රමාණය |
|---|---|---|
| 06 | අංක රහිත | පැනසොනික් රූපවාහිණී 01 |
| 07 | අංක රහිත | ජලයේ ගිල්වන වතුර මෝටර් 01 |
| 08 | අංක රහිත | විල්බැරෝ 01 |
| 09 | 55956 | ලී ඇඳන් 01, ජනෙල් පියන් 04, රොසෙල් වර්ගයේ වතුර පුරවන ටැංකි 01, සුදුපාට කොමඩ් 01 |
| 10 | අංක රහිත | මෝල් ගස් 01 |
| 11 | අංක රහිත | ගල් ඉන්නක් |
| 12 | අංක රහිත | සවල් 08 (300x8) |
| 13 | අංක රහිත | රෙදි කාපට් 02 |
| 14 | අංක රහිත | මන්න පිහි 04 (150x4) |
| 15 | අංක රහිත | කැති 01 |
| 16 | අංක රහිත | (ටැබ්) කුඩා පරිගණක 01 |
| 17 | අංක රහිත | ටීපෝ 01 |
| 18 | අංක රහිත | යකඩ බාල්දි 01 |
| 19 | අංක රහිත | යකඩ උල් 01 |
| 20 | අංක රහිත | ඇම්ප් 01 |
| 21 | අංක රහිත | උදලු තල 01 |
| 22 | අංක රහිත | වාහන ෂීට් කවර 01 |
| 23 | අංක රහිත | පඩික්කම් 01 |
| 24 | අංක රහිත | ඔරු ලාම්පු 01 |
| 25 | අංක රහිත | යකඩ පුනීල 01 |
| 26 | අංක රහිත | වාහන පැති කණ්නාඩියක් |
| 27 | අංක රහිත | පොරෝ 01 |
| 28 | අංක රහිත | බිත්ති ඔරලෝසු 02 |
| 29 | අංක රහිත | කම්පෙෂර් 01 |
| 30 | අංක රහිත | මාලු දැල් 01 |
| 31 | අංක රහිත | යකඩ කම්බි ප්‍රමාණයක් |
| 32 | අංක රහිත | යකඩ මෝටර් 01 |
| 33 | අංක රහිත | යකඩ වීල්බ්‍රෂ් 01 |
| 34 | අංක රහිත | දැල්කුඩ 01 |
| 35 | අංක රහිත | යකඩ ප්‍රමාණයක් |
| 36 | අංක රහිත | බියර් කේස් ප්‍රමාණයක් |
| 37 | අංක රහිත | පැදුරු ප්‍රමාණයක් |
| 38 | අංක රහිත | පාපැදි 01 |
| 39 | අංක රහිත | පාපැදි 01 |
| 40 | අංක රහිත | පාපැදි 01 |
| 41 | අංක රහිත | පාපැදි 01 |
| 42 | අංක රහිත | පාපැදි 01 |
| 43 | අංක රහිත | පාපැදි 01 |
| 44 | අංක රහිත | පාපැදි 01 |
| 45 | අංක රහිත | පාපැදි 01 |
| 46 | අංක රහිත | පාපැදි 01 |
| 47 | අංක රහිත | පාපැදි 01 |
| 48 | අංක රහිත | පාපැදි 01 |
| 49 | අංක රහිත | පාපැදි 01 |
| 50 | 71033 | SPUR 5114 යතුරු පැදිය |
| 51 | 52834 | SPMB 1954 යතුරු පැදිය |
| 52 | අංක රහිත | 128-5834 හොණ්ඩා චැලි ය/ පැදිය |
| 53 | අංක රහිත | 93-8543 හොණ්ඩා CD 90 |
| 54 | අංක රහිත | 139-8424 යතුරු පැදිය |
| 55 | අංක රහිත | VG-2979 සීග්‍රාCG 48Q ය/ පැදිය |
| 56 | අංක රහිත | UV - 3384 බජාජ් පල්සර් ය/පැදිය |
| 57 | අංක රහිත | JN - 2041 හීරෝ හොණ්ඩා ය/ පැදිය |
| 58 | අංක රහිත | WB - 9596 බජාජ් CD 100 |
| 59 | 64036 | 17-7386 ත්‍රී රෝද රථය |
| 60 | 27890 | SPGV - 7936 ත්‍රී රෝද රථය |

06-590

# රජයේ නොවන දැන්වීම්

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : ඊශ්වා ටෙක් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : PV 128920
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : 12 A, රෝහිනි පාර, කොළඹ 06
සංස්ථාගත කිරීමේ දිනය : 2018.01.16

ලියාපදිංචි ලේකම්වරු.

06-584

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : සෙවන්වින් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 131622
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 35, ''දිල්මිණි'' සමන්පුර, මහයාය වත්ත, ගොරකාපිටිය, පිළියන්දල
ලියාපදිංචි දිනය : 2018.04.10

සමාගමේ නම : අකිහබාරා ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00200152
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 327 සී, නීරංගමුව, වහකොටේ, මාතලේ
ලියාපදිංචි දිනය : 2018.05.08

සමාගමේ නම : ඇක්සස් නෙට්වර්ක්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 112854
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 70/4, දුම්රියපළ පාර, උඩහමුල්ල, නුගේගොඩ
ලියාපදිංචි දිනය : 2016.04.01

සමාගමේ නම : සම්පත් ලංකා ටෙක්නොලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 131365
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 38/ඒ, ගැමුණු මාවත, හන්තාන පෙදෙස, මහනුවර.
ලියාපදිංචි දිනය : 2018.04.03

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

06-586

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මීගමුව ඒත්තුකාල දොන් බොස්කෝ මාවත, අංක 17/11 හි පදිංචි වර්ණකුලසූරිය ජුඩ් නිරංසන් ලන්සා වන මම, ඒ. ඒ. බෂීර් අහමඩ් ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් වර්ෂ 2015ක් වූ සැප්තැම්බර් මස 01 වැනි දින සහතික කළ අංක 11169 දරන විශේෂ ඇටර්නි බලපත්‍රයෙන් කොච්චිකඩේ දළුවකොටුව නිම් වත්තේ පදිංචි ඔල්කින් ඉගෝර් හට දෙන ලද ඇටර්නි බලය අවලංගු කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

වර්ණකුලසූරිය ජුඩ් නිරංසන් ලන්සා.

06 - 587

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

මොරොන්තොට, හුණුගම්පොල සහ දූනට කැගල්ල තටාක පාර, අංක 167/29 පදිංචි රාජකරුණා මුදියන්සේලාගේ ප්‍රියන්ත සුමිත් විජේනායක (ජා. හැ. අංකය 721943178 V) වන මා විසින් ප්‍රසිද්ධ නොතාරිස් එල්. ඩබ්ලිව්. ඒ ද වාස් ගුණවර්ධන ප්‍රසිද්ධ නොතාරිස් සහතික කළ අංක 353 සහ 2013.03.11 දිනැති ඇටෝර්නි බලපත්‍රයෙන් පොතුහැර, තියඩෝර්වත්ත, අංක 29 පදිංචි දෙඹගහවත්තගේ චමින්ද කුමාර දෙඹගහවත්ත (ජා. හැ. අංකය : 721163229 V), පොල්ගහවෙල කොළඹ පාර, අංක 65 පදිංචි තෙල්ගේ නිරෝෂන පීරිස් (ජා. හැ. අංකය 733021527 V) සහ රුවන්වැල්ල, පහළ දන්නෝරුව, ඉහළගම පාර අංක ඩී 9/2 පදිංචි මාබුලගේ ජානක කැලුම් සේනාරත්න (ජා. හැ. අංකය 770262240 V) ද යන අයට දෙනු ලැබූ ඇටෝර්නි බලය අද දින පටන් අවලංගු කර බල රහිත කරන බව ශ්‍රී ලංකා ජනරජයට සහ ශ්‍රී ලංකා වාසී සියලු දෙනාම මෙයින් දැනගත යුතු ය.

රාජකරුණා මුදියන්සේලාගේ ප්‍රියන්ත සුමිත් විජේනායක.

06-588

## දැන්වීමයි

2007 අංක 07 දරන නව සමාගම් පනතේ 9 (1) වගන්තියේ විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : ලයිව් ෆයර් ග්‍රිල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 00200302
ලියාපදිංචි දිනය : 2018.05.16
ලියාපදිංචි ලිපිනය : RT.02.01.00, 2ND FLOOR, COLOMBO CITY CENTRE MALL, No. 137. SIR JAMES PEIRIS MAWATHA, COLOMBO 02.

සමාගමේ නම : ගොල්ඩන් සිටි ක්‍රෙඩිට් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 00200333
ලියාපදිංචි දිනය : 2018.05.17
ලියාපදිංචි ලිපිනය : අංක 11, නිකපේ පාර, නැදිමාල, දෙහිවල.

ලේකම්.

06-589

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳවයි.

සමාගමේ නාමය : එන්. එස්. ෆ්‍රීලිකික් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 127145
ලියාපදිංචි දිනය : 2017 නොවැම්බර් 13
ලිපිනය : අංක 23, පාම් ග්‍රෝව්, කොළඹ 03.

සමාගම් ලේකම්.

06-601

---

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : වෙයා සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 00200284
සමාගමේ ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : 133/ඊ, ටෙම්පල්ස් පාර, ගල්කිස්ස.

එම්. ඩී. කේ. එච්. ගුණතිලක,
අධ්‍යක්ෂ.

06-602

## ඇටර්නි බලය ප්‍රත්‍යාදිෂ්ය කිරීම

වත්තල, හැඳල, මරදන පාරේ අංක 23/4 හි පදිංචි ශ්‍රී රාමදස් සුබ්‍රමනියම් (ජාතික හැඳුනුම්පත් අංක 660441603 V හිමි) වන මා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ මහජනතාව වෙත මෙයින් දැනුම් දෙන වග නම් දෙදහස් දහතුනේ (2013) දෙසැම්බර් තිස්වන (30) දින දරන සහ 2014 මාර්තු 04 වන දින ලිඛිත බලධාරිකම් පොතේ 2155 වන වෙළුමේ 98 වන පත්‍රිරුවේ සටහන් අංක 113 යටතේ නිසි පරිදි ලියාපදිංචි කරන ලද විශේෂ ඇටර්නි බලපත්‍රය අහෝසි කොට ප්‍රත්‍යාදිෂ්ය කරනු ලබන අතර, 2018 මැයි 18 වැනි දින සිට එය බලරහිත හා ශූන්‍ය වන බව දැනගත යුතුයි.

06-603

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් දැනුම් දෙන ලද්දේ අංක 523 දරන 2016.12.16 දිනැති කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. සිදම්පරපිල්ලයි මහත්මිය විසින් සහතික කරන ලද වැල්ලවත්ත, පැත්සස් පාර, ලෝටස් තට්ටු නිවාස, අංක 15-1/3 හි පදිංචි කන්දයියා කුමාරසාමි යන අයට වැල්ලවත්ත, පැත්සස් පාර, ලෝටස් තට්ටු නිවාස, අංක 15 1/3 හි පදිංචි අකිලන් කුමාරසාමි නොහොත් කුමාරසාමි අකිලන් වන මා විසින් ලබාදුන් විශේෂ ඇටෝර්නි බලපත්‍රය 2018.05.24 වැනි දින සිට අවලංගු කර අහෝසි කරන ලදී. මෙදින සිට ඇටෝර්නි බලකරු විසින් ඉහත සඳහන් ඇටෝර්නි බලපත්‍රය යටතේ කරන ලද කිසියම් ක්‍රියාවලට සහ පියවරවලට මා වගකියනු නොලැබේ.

අකිලන් කුමාරසාමි.

2018.05.24.

06-604

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සීදුව, අමන්දොළුව, අංක 42/7 දික්වෙල අතුරු පාර හි පදිංචි රූපසිංහ ආරච්චිලාගේ දම්මිකා රූපසිංහ වන මම වර්ෂ 2015 සැප්තැම්බර් මස 25 වැනි දින, එන්. එල්. විරාජ් ජයසිංහ ප්‍රසිද්ධ නොතාරිස් මහතා ලියා සහතික කළ අංක 718 දරන ඇටෝර්නි බලපත්‍රයෙන්, ඒකල, ගම්පහ පාර, මිහිඳු මාවතේ, අංක 80/14 ඒ, හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 199561401354 හිමි හේරත් මුදියන්සේලාගේ ඉෂාරා, හේමමාලි හේරත් යන අයට දෙන ලද ඇටෝර්නි බලය 2018 මැයි මස 23 දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

රූපසිංහ ආරච්චිලාගේ දම්මිකා රූපසිංහ.

06-631

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම පනතේ 9 (1) වගන්තියේ විධිවිධාන යටතේ පහත නම සඳහන් සමාගම සංස්ථාගත කළ බව දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ලෙවිලින් හොල්ඩිංස් ප්‍රයිවට් (ලිමිටඩ්)
සමාගමේ අංකය : පී වී 132027
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 592/2, 10 වන සැතපුම් කණුව, අතුරුගිරිය, මාලබේ.

අධ්‍යක්ෂ.

06-632

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම පනතේ 9 (1) වගන්තියේ විධිවිධාන යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කළ බව දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : එන්. එම්. ආර්. ඉන්ටරිම් ප්‍රයිවට් (ලිමිටඩ්)
සමාගමේ අංකය : පී වී 132051
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 176, කාසල් වීදිය, කොළඹ 08.

අධ්‍යක්ෂ.

06-633

---

## ප්‍රසිද්ධ දැන්වීම

ද සොෆ්ට්වෙයාර් ෆිර්ම් (පුද්ගලික) සමාගම (සමාගම් අංකය පී වී 00200195) වර්ෂ 2018 මැයි මස 12 වැනි දින සංස්ථාගත කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) උපවගන්තිය ප්‍රකාරව මෙයින් සැම දෙනාගේ ම දැනගැනීම පිණිස දැනුම් දෙනු ලැබේ.

ලියාපදිංචි කාර්යාලය : අංක 138, අලදෙණිය, වැරැල්ලගම, මහනුවර.

06-635

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : සවියුරු (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 130919
සංස්ථාපිත දිනය : 2018 මාර්තු මස 20 වැනි දින
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 67/96, සුහද මාවත, සිරිමල් උයන, ඉඳිගොල්ල, ගම්පහ.

කළමණාකාර අධ්‍යක්ෂක.

06-637

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

පිළියන්දල, මිරිස්වත්ත, හොරණ පාර, අංක 63/ඒ/3 හි පදිංචි අමරසිංහ ආරච්චිගේ ගිහාන් කුමාර වන මම ශ්‍රී ලංකාව, පිළියන්දල, මහරගම පාර,තරුණ බෞද්ධ සමිති ගොඩනැගිල්ල, අංක 15/15 හි පදිංචි අමරසිංහ ආරච්චිගේ පාලිත අමරසිංහ යන අය වෙත ඇටෝර්නි බලය පවරන ලද 2008.06.28 වැනි දින ලියා සහතික කරන ලද අංක 1082 දරන ඇටෝර්නි බලපත්‍රයේ 334 කාණ්ඩයේ 118 පත්‍රිරුවේ 9815 දරන දින පොත් අංකය යටතේ 2006.07.28 වැනි දින ලියාපදිංචි වී ඇති ඇටෝර්නි බලපත්‍රය අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත්, මෙයින් දැනුම් දෙමි. මින් ඉදිරියට එකී ඔහු විසින් මා වෙනුවෙන් කරනු ලබන කිසිම ගනුදෙනුවකට මා වග නොකියන බව ද මින් දන්වා සිටිමි.

අමරසිංහ ආරච්චිගේ ගිහාන් කුමාර.

06-700

---

## ඇටර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පිළියන්දල, මාම්පේ පී. එස්. පෙරේරා මාවත, ''අජන්ත'' අංක 111සී හි පදිංචි දොන් ලෙස්ලි ලීලාරත්න හඳුන්ගේ (ජාතික හැඳුනුම්පත් අංක 531880412V) වන මා විසින් පිළියන්දල, මාම්පේ, පී. එස්. පෙරේරා මාවත, ''අජන්ත'' අංක 111සී හි පදිංචි දොන් ශ්‍රියා හඳුන්ගේ රත්නායක යන අය වෙත ප්‍රසිද්ධ නොතාරිස් ප්‍රශංසා අලවත්ත මහත්මිය විසින් වර්ෂ 2008 ක් වූ ජනවාරි මස 02 වැනි දින සහතික කරන ලද අංක 87 දරන ඇටර්නි බලය අද පටන් (2014.05.27) අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් සියලු පුරවැසියන්ටත් මෙයින් දැනුම් දෙමි. මින් ඉදිරියට දොන් ශ්‍රියා හඳුන්ගේ රත්නායක යන අය මා නමින් සිදු කරන කිසිදු කාර්යයක් සම්බන්ධයෙන් මා වගනොකියන බව මෙයින් දන්වා සිටිමි.

06-704

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කඩුවෙල, කොතලාවල, විහාර මාවත, අංක 74/4 හි පදිංචි සන්ධ්‍යා මානෙල් සිල්වා (ජා. හැ. අංක 675540810 V) වන මා විසින් හෝකන්දර, හෝකන්දර උතුර, ජයගත් මාවත, අංක 141/ඩී හි පදිංචි මීරුප්පගේ විමල් (ජා. හැ. අංක 583581243 V) යන අය මාගේ ඇටර්නි බලකරු ලෙස පත් කරමින් එච්. එන්. එස්. හඳුන්නෙත්ති ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 2010.02.01 වැනි දින ලියා සහතික කළ අංක 4722 දරන ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බව සියලු දෙනාටම මෙයින් දැනුම් දෙමි.

මින් ඉදිරියට එකී ඇටර්නි බලකරු විසින් ඉහත කී ඇටර්නි බලපත්‍රය යටතේ කරනු ලබන කිසිදු ක්‍රියාවක් සම්බන්ධයෙන් මා වගකීම් නොදරන බව සියලු දෙනාට ම මෙයින් දැනුම් දෙමි.

සන්ධ්‍යා මානෙල් සිල්වා.

06-728

## දැන්වීමයි

මාස් අමාලියා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ (ලියාපදිංචි අංකය පීවී 12488) ප්‍රකාශිත ප්‍රාග්ධනය වන ශ්‍රී ලංකා රුපියල් එකසිය විසි මිලියන පන් ලක්ෂයක් (රුපියල් 120,500,000) මුදල, ශ්‍රී ලංකා රුපියල් එකොළොස් මිලියන අට ලක්ෂ පන්දහසක් (ශ්‍රී ලංකා රුපියල් 11,805,000) දක්වා අවකරණය කිරීමට යෝජනා කොට ඇති බව, 2007 අංක 07 දරන සමාගම් පනතේ 59 (2) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

06-672

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය ප්‍රකාර මෙසේ සමාගම ලියාපදිංචි කර ඇති බව මෙයින් දන්වමි.

සමාගමේ නම : ජෙකෝ ටෙක් (පීවීටී) එල් ටී ඩී
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 9/එෆ්/2, සමිඳු මාවත,
කුඩාමාදුව පාර, මත්තේගොඩ
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 131654
සමාගමේ ලියාපදිංචි දිනය : 2018.04.11

සමාගම් ලේකම්.

06-683

---

## ඇටර්නි බලපත්‍රය අහෝසි කිරීම

කොච්චිකඩේ, මානවේරිය, මඩම්පැල්ල පාර, අංකඃ 72/1ඒ දරන ස්ථානයේ පදිංචි ගම්පලගේ ප්‍රසාද් මංජුල පොන්සේකා (ජාතික හැඳුනුම්පත් අංකයඃ 842562767V) මා විසින් මීගමුව අධිකරණයේ ප්‍රසිද්ධ නොතාරිස් ටී .ජේ. එම්. සොනාලි ප්‍රනාන්දු විසින් ලියා සහතික කල අංකඃ 1284 හා 2017.04.22 දතම දරන ඇටර්නි බලපත්‍රය මගින් කොච්චිකඩේ, ඇත්ගාල, තේක්කවත්ත, අංක 79/1 හි පදිංචි ගෙවලන් ආරච්චිගේ විනි තෙරේසා (ජාතික හැඳුනුම්පත් අංකයඃ 575313990V) යන අය වෙත පවරන ලද විශේෂ ඇටර්නි බලපත්‍රය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරන බවත් මා වෙනුවෙන් ඇය විසින් කරනු ලබන කිසිවකට වග නොකියන බවත් උතුම් වූ ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ගම්පලගේ ප්‍රසාද් මංජුල පොන්සේකා.

06-772

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාගත කරන ලදී.

| *සමාගමේ නම* | *සමාගම් අංකය* | *ලිපිනය* |
|---|---|---|
| සීකෝ කන්සල්ටිං (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 128889 | 45 1/1, ලැයාඩ් රෝඩ්, කොළඹ 5 |
| මයිටියුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 128862 | 36/6 ඒ, පැරකුම් මාවත, නාවල පාර, නුගේගොඩ |
| ඒ රී එම් සී කන්සල්ටන්ට් (පීවීටී) එල්ටීඩී | පී වී 129133 | 282/3/7, ලිබර්ටි ආර්කෙඩ්, 3 ෆ්ලොර්, ඊ ඒ ඩී මෙල් මාවත, කොළඹ 03 |
| මේතොඩ්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 128664 | අංක 51/1, නිගම්බු රෝඩ්, වත්තල |
| සී සී එල් ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී | පී වී 129444 | 29, 5 ලෙන්, නාවල රෝඩ්, නාවල, රාජගිරිය |
| එස් පී ලංකා ප්‍රොපර්ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 130221 | අංක 4 1/1, 2 ෆ්ලොර්, ගීතාන්ජලි ප්ලැස්, ගෝල් රෝඩ්, කොළඹ 3 |
| සීපොල් සොර්සිං කම්පැනි (පීවීටී) එල්ටීඩී | පී වී 130781 | 16 ඒ, 3 වන ලේන්, වුඩ්ලන්ස් මාවත, කොහුවල |
| හෝම්ස් ආර් අස් (පීවීටී) එල්ටීඩී | පී වී 130804 | අංක 5 ඒ, පල්ලිය පාර, පැලවත්ත, බත්තරමුල්ල |
| අයි. කේ. ට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 130928 | අංක 25, බුවනෙකබා මාවත, මිරිහාන, පිටකෝට්ටේ |
| ස්ටෙක්ස් ප්ලම්බින්ග් (පීවීටී) එල්ටීඩී | පී වී 131322 | අංක 114 ඒ, අටිතරාගොඩ රෝඩ්, උණවටුන 80600 |
| මාස් ටෙක්සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 131607 | අංක 33 ඒ, බොස්වල් ප්ලේස්, කොළඹ 6 |
| නිටියෝ ඉන්ෆෝටෙක් සර්විසස් එස්. එල්. (පීවීටී) එල්ටීඩී | පී වී 131754 | අංක 280, එල්විටිගල මාවත, කොළඹ 08. |

අධ්‍යක්ෂ.

06-731

---

## ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් රම්‍යා අලහේන්ද්‍ර විසින් ලියා සහතික කරන ලද 2018 මැයි මස 23 වැනි දිනැති අංක 4423 දරන ඇටෝර්නි බලපත්‍ර ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමේ ලේඛනය මගින් කොළඹ 02, සර් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි බැංකු සමාගමක් වන සම්පත් බැන්ක් ලිමිටඩ් හි කළමණාකාර අධ්‍යක්ෂ නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් අනුජා මදාවිකා කුමාරි අබේවික්‍රම ගුණතිලක විසින් ලියා සහතික කරන ලද 2000 දෙසැම්බර් මස 20 වැනි දිනැති අංක 2476 දරන විශේෂ ඇටෝර්නි බලත්‍රය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ 07, වෝඩ් පෙදෙස, අංක 150/3 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සමාගම් ලියාපදිංචි අංක පීවී 122 දරන සීඩ්ල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වන අපි ප්‍රත්‍යාදිෂ්ඨ කර ඇති බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව වෙත සහ මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සම්පත් බැන්ක් ලිමිටඩ් හි කළමණාකාර අධ්‍යක්ෂ විසින් අපි උදෙසා සහ වෙනුවෙන් කරනු ලැබිය හැකි වන යම් දෙයක් වෙනුවෙන් සීඩ්ල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වන අපි වගකීම භාර නොගන්නවා ඇත.

සීඩ්ල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අධ්‍යක්ෂ.

2018 ජුනි මස 11 වැනි දින දී ය.

06-975

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**මහජන බැංකුව - කැන්ඩි සිටි සෙන්ටර් ශාඛාව**

අංක 1986 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතෙහි 29 ඩී වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුළුගම්මන සියපත්තුවේ අක 420 පොල්වත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කොන්ඩදෙනිය ග්‍රාමයේ පිහිටි ''මලුමුරපංගුව හෙවත් හිටිනාවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සුසිර ඒකනායක විසින් සාදන ලද 2013 ඔක්තෝබර් මස 04 වැනි දින මැන සාදන ලද අංක 5044 දරන පිඹුරේ දැක්වෙන විශේෂිත බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූඩ්. 0 පර්. 17.2
එහි පිහිටි ඉඩම්, ගොඩනැගිලි, වගාවන් සහ සියල්ල සහිතව
මහනුවර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්තිරු අංක ඊ 28/134 යටතේ ලියාපදිංචි කර ඇත.

*දේපළ වෙත පිවිසීම.* - මහනුවර කුරුණෑගල පාරේ වමට ඇති ගොහාගොඩ පාරට හැරී මීටර් 100ක් පමණ ගමන් කරන විට ඇති කිලෝමීටර් 10 කණුව අසලට පිවිසෙන්න. එතැනින් ජලසම්පාදන පාරට හැරී මීටර් 300ක් පමණ ගමන් කරන්න. එතැනින් වමට හැරී තවත් මීටර් 100ක් පමණ ගමන් කරන්න. දකුණට හැරී මීටර් 10ක් පමණ ගමන් කරන්න. අදාළ දේපළ පාරේ දකුණු පසින් පිහිටා ඇත.

මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ 2018 ජූලි මස 05 වැනි බ්‍රහස්පතින්ද දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*තීරණය පිළිබඳ දැන්වීම.* - කරුණාකර 2017 ඔක්තෝබර් මස 20 වැනි දින රජයේ ගැසට් පත්‍රය, ''දිනමිණ'', ''ඩේලි නිවුස්'' සහ ''තිනකරන්'' පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - මිල තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ දී පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය .

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2 (සියයට දෙකහමාර) සහ එම කොමිස් මුදලට අදළ සියලුම බදු,
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500.00,
5. අලෙවිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම්,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු.

ගැනුම් මිලෙන් 90% (සියයට අනූව) ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ප්‍රාදේශීය කළමනාකරු, මහජන බැංකුව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, අංක 17, දළඳ වීදිය, මහනුවර වෙත ගෙවිය යුතු වේ. දුරකතන අංක : 081 - 2228383/2234283,
ෆැක්ස් අංක : 081 2223017/2223123.

ඉහත සඳහන් කළ පරිදි දින 30ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 10% ක මුදලක් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතු වේ.

ඔප්පු සහ අනෙකුත් ලියකියවිලිවල පිටපත් ඉහත කී ලිපිනයෙන් ලබාගත හැක.

''ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි''

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්,
වසර 126 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය සහ ප්‍රදර්ශනාගාරය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය :*
6 ඒ, ෆෙයාර් ෆීල්ඩ් ගාර්ඩන්,
කොළඹ 08.
දුරකථන අංක : 011-2671467, 011- 2671468
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2671469
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

06-600

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

(1) ණය යොමු අංක : 71053951 සහ 75994749.
ගම්පහ, නාරංවල, අංක 39/5 හි සුභද්‍ර කංකානම්ලාගේ ශ්‍රියානි මල්ලිකා මහත්මියට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

(2) ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2018.03.29 දිනැති අංක 2065 දරන ගැසට් පත්‍රයේ හා 2018.03.21 වැනි දින ''දිනමිණ'' ''ඩේලිනිව්ස්'' හා ''තිනකරන්'' යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද, අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2018.07.10 වැනි දින පෙ. ව. 10.30 ට කොලොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

**ඉහත සඳහන් උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ, අධිකාරි පත්තුවේ බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 272/A දරන මීගහවත්ත බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බියගම ප්‍රාදේශීය සභා සීමාවේ මීගහවත්ත ග්‍රාමයේ පිහිටි ගොරකගහලන්ද නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. ඒ. වී. පෙරේරා විසින් සාදන ලද 1967 ජනවාරි මස 24 දිනැති අංක 354 දරන පිඹුරෙහි ලොට් K, H සහ G ලෙස දක්වා නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම්, එකී ලොට් K, H සහ G උතුරට : ඩී. ඒ. ජාන්සිඤ්ඤෝට අයත් ලොට් 13 ද, නැගෙනහිරට : එකී අංක 354 දරන පිඹුරෙහි මෙම ඉඩමේ ලොට් D ද, දකුණට : අඩි 12 පළල පාරට වෙන් කළ මෙම ඉඩමෙහි ලොට් L සහ පී. ජී. ඥාණදාසට අයත් ලොට් J සහ ලොට් 15 ද, බස්නාහිරට : කලින් ආර්. ඒ. ඊට්න් පෙරේරා සහ වෙනත් අයට අයත්ව තිබූ දැනට ආර්. ඒ. පීටර් සිංඤ්ඤෝට අයිති ඉඩම ද මායිම්ව එකී අංක 354 දරන පිඹුරට අනුව රූඩ් එකයි පර්චස් තිහක (අ. 0, රූ. 1, පර්. 30) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති සහ වැඩෙන ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 875/283 හි ලියාපදිංචි කර ඇත.

යාබද ලොට් K, H සහ G ලෙස දක්වා ඇති එකී බෙදූ ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු එල්. ජේ. ලියනගේ විසින් වඩාත් මෑතකදී මැන සාදන ලද 2008 ඔක්තෝබර් මස 29 දිනැති අංක 11333 දරන පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කර ඇත.

එකී මීගහවත්ත ග්‍රාමයේ පිහිටි ගොරකගහලන්ද නමැති ඉඩමේ අංක 11333 දරන පිඹුරෙහි ලොට් X ලෙස දක්වා නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම්, එකී ලොට් X උතුරට : කලින් ඩී. ඒ. ජාන් සිඤ්ඤෝට අයිති දැන් ඩී. ඒ. පද්මසේනට අයිති අංක 1285 දරන පිඹුරෙහි ලොට් 13 ද, නැගෙනහිරට : එම්. කේ. එස්. රණසිංහගේ අංක 354 දරන පිඹුරෙහි ලොට් D ද, දකුණට : අංක 354 දරන පිඹුරෙහි ලොට් L (අඩි 12 පළල පාර) සහ කලින් පී. ජී.ඥානදාසට අයිති දැන් පී. ජී. ගාමිණීට අයත් අංක 1285 දරන පිඹුරෙහි ලොට් 15 ද, බස්නාහිරට : ඇළ ද මායිම්ව එකී අංක 11333 දරන පිඹුරට අනුව රූඩ් එකයි පර්චස් විසිඅටක (අ.0, රූ.1, පර්.28) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති සහ වැඩෙන ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ.

මේ සමග මෙයට එකී අංක 354 දරන පිඹුරෙහි නිරූපිත ලොට් L (අඩි 12 පළල පාර) දිගට හා ඒමතින් පාරේ අයිතිය ද ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එන්. දේදුනු මිය,
කළමනාකරු.

ලංකා බැංකුව,
කඩවත අධිශ්‍රේණී ශාඛාව.

06-739

---

LE/RE/208.

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව**

**(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම**

ණය අංකය : 803725000116.

ණයකරුගේ සම්පූර්ණ නම : වෙදගේ පාලිත කුමාර වෛද්‍යරත්න.

(මෙහි මින් මතු ''බැංකුව'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 සහ 2011 අංක 45 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2018.05.11 වැනි දින අංක 2071 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 2018.05.04 වැනි දින ''ලංකාදීප'', ''තිනක්කුරල්'' සහ ''ද අයිලන්ඩ්'' යන පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 369/1, දුටුගැමුණු මාවත, ලේවැල්ල පාර, මාවිල්මඩ, මහනුවර ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් 2018.07.11 වැනි දින පෙ. ව. 11.00 සිට පහත උපලේඛනයේ

විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

අංක 1292 දරන උකස් බැඳුම්කරය යටතේ රුපියල් හැටතුන් ලක්‍ෂ නව දහස් හයසිය පනස් හතරයි ශත හතලිස් එකක (රු.6,309,654.41) මුදලක් වර්ෂ 2018.02.28 වැනි දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(01) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් පනස්පන් ලක්‍ෂ විසි දහස් හාරසිය අසූදෙකයි ශත අනූහතර (රු. 5,520,482.94) ක මුදල ද වර්ෂ 2018.02.28 වැනි දින දක්වා හිඟ මුදල වශයෙන් රුපියල් හත් ලක්‍ෂ අසූනව දහස් එකසිය හැත්තෑ එකයි ශත හතලිස් හත (රු. 789,171.47) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හැටතුන් ලක්‍ෂ නව දහස් හයසිය පනස් හතරයි ශත හතලිස් එක (රු. 6,309,654.41) ක මුදල අයකර ගැනීම සඳහා ද,

(02) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ මුදල වන රුපියල් පනස්පන් ලක්‍ෂ විසි දහස් හාරසිය අසූදෙකයි ශත අනූ හතර (රු. 5,520,482.94) ක මුදල මත අයවිය යුතු වර්ෂයකට 17.50%ක් බැගින් වූ පොළිය 2018.03.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(03) එකී රුපියල් හත් ලක්‍ෂ අසූනව දහස් එකසිය හැත්තෑ එකයි ශත හතලිස් හත (රු. 789,171.47) ක මුදල මත අය විය යුතු මාසිකව 2.00%ක ප්‍රමාද පොළියක් 2018.03.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සිදු කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(04) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීම සඳහා ද වේ.

**ඉහත කී උපලේඛනය**

***පළමුවන උපලේඛනය***

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කන්තලේ කෝරළයේ, කන්තලේ පත්තුවේ, කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්තලේ ප්‍රාදේශීය සභා සීමාවේ අංක 227 - කන්තලේ නගරය දරන ග්‍රාම නිලධාරී වසම තුළ කන්තලේ බටහිර කොට්ඨාස අංක 02 හි කන්තලේ ග්‍රාමයෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් සාදනු ලැබ ඔහු භාරයේ ඇති අංක F. T. P. 2, INSET 112 පිඹුර ප්‍රකාර කැබලි අංක 3981 නමැති ගොඩ ඉඩම් කොටසට මායිම්, උතුරට: කැබලි අංක 3980 ද, නැගෙනහිරට : කැබලි අංක 3979 ද, දකුණට : කැබලි අංක 3979 සහ 3999 ද සහ බටහිරට : කැබලි අංක 3982 ද යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් එකක (අ. 0, රූ. 02, පර්. 01) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේ ද සමග වේ.

ඉහත සඳහන් සීමා මායිම් තුළ, කන්තලේ ග්‍රාමයෙහි පිහිටි එකී ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. සී. එම්. රාෆික් විසින් මැනක දී මැන සම්පාදිත 2015.05.11 දිනැති අංක 7032 දරන පිඹුර ප්‍රකාර කන්තලේකාඩු ලෙස සඳහන් ඉඩමෙහි කැබලි අංක 01 නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට : පිඹුරු අංක F. T. P. 2 හි කැබලි අංක 3980 සහ 3979 ද, නැගෙනහිරට : පිඹුරු අංක F. T. P. 2 හි කැබලි අංක 3979 සහ 3999 ද, දකුණට : පිඹුරු අංක F. T. P. 2 හි කැබලි අංක 3979, 3999 සහ 3982 ද සහ බටහිරට : පිඹුරු අංක F. T. P. 2 හි කැබලි අංක 3982 සහ 3980 ද යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් එකක (අ. 0, රූ. 02, පර්. 01) හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම දෙකයි බිංදුවයි හතරයි නවයක (හෙක්. 0.2049) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේ ද සමග ත්‍රිකුණාමලය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO/P/19/17 හි ලියාපදිංචි කර ඇත.

මෙම ඉඩම අංක ත්‍රි/ප්‍ර/178 දරන ප්‍රදාන පත්‍රයේ සඳහන්, (464 වැනි අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනතේ විධිවිධානවලට සහ රක්ෂිත වගන්ති හා කොන්දේසිවලට යටත්ව බැංකුවට උකස් කිරීම සඳහා, කන්තලේ සහකාර ඉඩම් කොමසාරිස්ගේ පූර්ව අනුමැතිය ඔහුගේ යොමු අංක KN/178(G) දරන 2017.01.25 දිනැති ලිපියෙන් ප්‍රදානය කර ඇත.

**දෙවන උපලේඛනය**

**රක්ෂිත වගන්ති (වෙන්කිරීම්) :**

1. ඉඩම තුළ හෝ ඒ මත ඇති සියලු ඛණිජවල (මෙම යෙදුමට මෙම ප්‍රදානයේ දී වටිනා ගල් ද ඇතුළත් වේ.) හිමිකම සහ කැණීමට, සෝදිසි කිරීමට, වැඩ කිරීමට හා එවන් ඛනිජ බැහැරට ගෙනයාමට ඇති අයිතිය රජය වෙත වෙන්කර තබා ඇත.

2. ඉඩමට අයිතිකරු වශයෙන් ඇති හිමිකම මෙම ප්‍රදානය කරනු ලබන දිනයට ඉඩම මත පවතින මාර්ග අයිතිය හෝ ඉඩම මත ඇති අනෙකුත් පරවශතාවන්ට යටත් වේ.

**කොන්දේසි :**

1. අයිතිකරු ඉඩමේ බෙදූ කොටසක අයිතිය බැහැර නොකළ යුතු ය.

2. අයිතිකරු ඉඩමේ නොබෙදූ කොටසට අයිතිය බැහැර නොකළ යුතු ය.

3. කිසිම තැනැත්තෙකුට ඉඩමේ බෙදූ කොටසක අයිතිකරුවකු විය නොහැක.

4. කිසිම තැනැත්තෙකුට ඉඩමේ නොබෙදූ කොටසක අයිතිකරුවකු විය නොහැක.

5. ඉඩමට හෝ එහි කිසියම් කොටසකට ජලය සැපයිය හැකි නම් හෝ දැනටමත් ඉදිකර ඇති යම් වාරිමාර්ග කාර්යයන් ඉදිකිරීමක් හෝ ඉදිකිරීමට ඇති යමක් හේතුවෙන් ජලය සැපයිය හැකි බවට පත්වන්නේ නම් හෝ එම ජලය සැපයිය හැකි ප්‍රදේශය සම්බන්ධයෙන් අයිතිකරු (453 වැනි අධිකාරය වූ) වාරිමාර්ග ආඥාපනතේ විධිවිධානවලට හා ඒ යටතේ සාදන ලද රීතිවලට අනුකූලව කටයුතු කළ යුතු ය.

6. දිසාපතිගෙන් ලිඛිතව අවසරයක් සහ අදාළ අධිකාරිගෙන් බලපත්‍රයක් ලබා නොගෙන එම ඉඩම මත හෝ ඒ තුළ ඇති කිසිදු ඛනිජ ද්‍රව්‍යයක් හැරීම, සෙවීම, භාවිතයට ගැනීම අයිතිකරු විසින් නොකළ යුතු ය.

7. ප්‍රාදේශීය ලේකම්ගේ පූර්ව අනුමැතිය ලිඛිතව ලබා නොගෙන මෙම ඉඩම හෝ එහි ඕනෑම කොටසක් බැහැර නොකළ යුතු ය.

ත්‍රිකුණාමලය ප්‍රසිද්ධ නොතාරිස් එම්. බී. අන්ෆාර් විසින් 2017.02.28 වැනි දින ලියා සහතික කරන ලද අංක 1292 දරන උකස්කරය අනුව මෙහි දක්වා ඇති උපලේඛනය පරීක්ෂා කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2018 ජූනි මස 01 වැනි දින,
ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව,
ජාතික නිවාස සංවර්ධන අධිකාරි ගොඩනැගිල්ල,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත,
තැ. පෙ. 2085,
කොළඹ 02.

06-726

---

LE/RE/208.

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

### (කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

නව ණය අංක (එහි පැරණි ණය අංක) : 604725000122 (1827200024), 604725000123 (1827200049).

ණයකරුවන්ගේ සම්පූර්ණ නම් : බාලසූරිය මුදියන්සේලාගේ නවරත්න බාලසූරිය සහ හිටිහාමි මුදියන්සේලාගේ විශාඛා රත්නායක මැණිකේ.

(මෙහි මින් මතු ''බැංකුව'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 සහ 2011 අංක 45 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2018.05.11 වැනි දින අංක 2071 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 2018.05.14 වැනි දින ''ලංකාදීප'', ''තිනක්කුරල්'' සහ ''ද අයිලන්ඩ්'' යන පුවත්පත්වල පළකරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 369/1, දුටුගැමුණු මාවත, ලේවැල්ල පාර, මාවිල්මඩ, මහනුවර ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය විසින් 2018.07.26 වැනි දින පෙ. ව. 11.00 සිට පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

අංක 625 සහ 8195 දරන උකස් බැඳුම්කරයන් යටතේ රුපියල් හැත්තෑ හතර ලක්ෂ අසූ දහස් හත්සිය තිස් එකයි ශත පනස් එක (රු. 7,480,731.51) ක මුදලක් වර්ෂ 2018.02.28 වැනි දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(01) පළමු ණය මුදල : 604725000122 (1827200024)

අංක 625 දරන උකස් බැඳුම්කරය යටතේ එකී පළමු ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හතළිස් හය ලක්ෂ අනූ නව දහස් අටසිය අසූවයි ශත හැට තුනක (රු. 4,699,880.63) මුදල ද වර්ෂ 2018.02.28 වැනි දින දක්වා හිඟ මුදල වශයෙන් රුපියල් දස ලක්ෂ එක් දහස් අසූ තුනයි ශත දොළහක් (රු. 1,001,083.12) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් පනස් හත් ලක්ෂ නවසිය හැට තුනයි ශත හැත්තෑ පහ (රු. 5,700,963.75) ක මුදල අයකර ගැනීම සඳහා ද,

දෙවන ණය මුදල : 604725000123 (1827200049)

අංක 8195 දරන උකස් බැඳුම්කරය යටතේ එකී දෙවන ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දහතුන් ලක්ෂ පනස් පන් දහස් අටසිය හතළිස් හතයි ශත විසි තුනක (රු. 1,355,847.23) මුදල ද වර්ෂ 2018.02.28 වැනි දින දක්වා හිඟ මුදල වශයෙන් රුපියල් හාර ලක්ෂ විසි තුන් දහස් නවසිය විස්සයි ශත පනස් තුනක් (රු. 423,920.53) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දහහත් ලක්ෂ හැත්තෑ නව දහස් හත්සිය හැට හතයි ශත හැත්තෑ හයක් (රු. 1,779,767.76) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හැත්තෑ හතර ලක්ෂ අසූ දහස් හත්සිය

තිස් එකයි ශත පනස් එකක් (රු. 7,480,731.51) ක මුදලක් අයකර ගැනීම සඳහා ද,

(02) එකී පළමු ණය මුදලෙන් ආපසු නොගෙවූ මුදල වන රුපියල් හතලිස් හය ලක්ෂ අනූ නව දහස් අටසිය අසූවයි ශත හැට තුනක (රු. 4,699,880.63) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.00% ක් ද සහ එකී දෙවන ණය මුදලෙන් ආපසු නොගෙවූ මුදල වන රුපියල් දහ තුන් ලක්ෂ පනස් පන් දහස් අටසිය හතලිස් හයයි ශත විසි තුනක (රු. 1,355,847.23) මුදල මත අයවිය යුතු වර්ෂයකට 16.00% බැගින් වූ පොළිය 2018.03.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(03) එකී රුපියල් දහ හතර ලක්ෂ විසි පන් දහස් තුනයි ශත හැට පහක (රු. 1,425,003.65) මුදල මත අය විය යුතු මාසිකව 2.00% ක ප්‍රමාද පොළියක් 2018.03.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සිදු කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(04) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීම සඳහා ද වේ.

නව ණය අංක (එහි පැරණි ණය අංක) 604725000122 (1827200024)
604725000123 (1827200049)

### උපලේඛනය

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, තිස්සව කෝරළේ පඬුවස්නුවර ප්‍රාදේශීය සභා සීමාව තුළ සහ පඬුවස්නුවර - බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක : 1356 - නල්ලූර ග්‍රාම නිලධාරි වසමේ වඩුගම ග්‍රාමයෙහි පිහිටි "වඩුගම වත්ත" නමැති ඉඩමට 2005.03.21 වැනි දින වයි. එම්. ඒ. යාපා මානක විසින් මැන සම්පාදිත අංක : 6012 දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 1 දරන කොටසට මායිම් : උතුරට : පී. එම්. පොඩිරාළහාමි සතු ඉඩම ද, නැගෙනහිරට : කට්ටපිටිය සිට වඳුරුස්ස දක්වා වන මාර්ගය ද, දකුණට : බී. එම්. ගුණතිලක සතු ඉඩම සහ බී. එම්. පොඩිමැණිකා සතු ඉඩම ද සහ බස්නාහිරට : රජය සතු වැව ද යන මායිම් තුළ පිහිටි අක්කර තුනක (අ. 3, රූ. 0, පර්. 0) සහ හෙක්ටයාර් 1.2141 ක වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් ගොඩනැගිලි, ගහකොළ, පලතුරු ආදී සියලු දේ ද සමග කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක Q 85/32 හි ලියාපදිංචි කර ඇත.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඩී. තිලක්සේන විසින් 2015.11.17 වැනි දින ලියා සහතික කරන ලද අංක 625 දරන උකස්කරය සහ නිකවැරටිය ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. එන්. අයි. බණ්ඩාර විසින් 2016.06.10 වැනි දින ලියා සහතික කරන ලද අංක 8195 දරන උකස්කරයන් අනුව මෙහි දක්වා ඇති උපලේඛනය පරීක්ෂා කරන ලදී.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

වැ. බ. සාමාන්‍යාධිකාරි,

2018 ජුනි මස 01 වැනි දින,
ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව,
ජාතික නිවාස සංවර්ධන අධිකාරි ගොඩනැගිල්ල,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත,
තැ. පෙ. 2085,
කොළඹ - 02

06-727

---

## නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. - වව්නියාව ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ඉතා වටිනා ව්‍යාපාරික දේපලක් වව්නියා දකුණු දෙමළ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ මරුක්කරම්පලායි 218සී ග්‍රාම නිලධාරි වසම තුළ මරුක්කම්පලායි ගමේ පිහිටි "මරුක්කරම්පලි" නමැති ඉඩමට මිනුම්පති විසින් සාදන ලද TOPO PP57 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 635 නමැති ඉඩම් කොටස සහ එහි තුළ පිහිටි නිවාස සහ ව්‍යාපාරික ගොඩනැගිලි, කර්මාන්ත ශාලා සහ අනෙකුත් ගොඩනැගිලි, ගහකොළ, වගාව ඇතුළු සියලු දේ. ඉඩමේ ප්‍රමාණය : අක්කර 01

ඉහත කී ඉඩම මත ස්ථිර ලෙස සවිකර ඇති හෝ තබා ඇති සහ කලින් කල ගෙන එනු ලබන සෑම සියළු ආකාරයකම නිශ්චල යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ සවිකිරීම් ඇමුණුම් සහ සේවා සමග විදුලිය, ජලය, විදුලි සංදේශ, වායු සමීකරණ උපකරණද ඇතුළුව වේ.

මෙම දේපළ වව්නියාවේ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති සමාගම් පනත යටතේ නිසි ලෙස ලියාපදිංචි සමාගමක් වන නොදර්න් ෆාම් (පුද්ගලික) සමාගම සහ වව්නියාවේ පදිංචි කල්‍යානි සිවරුබන් යන අය උකස්කරු/ණයට ගන්නන් වශයෙන් නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවට බැංකුවට සුරක්ෂිත කර ඇත.

